**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2016 වර්ෂය**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සම්මේලනයේ යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක සභාවේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක සභාවේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සම්මේලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් ලෙස ඇතුළත් විය යුතු රු. 169,850 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ තොගය ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ පවත්වන ලද තරඟාවලි 4 ක් සහ පුහුණු පාඨමාලාවක් සඳහා අනුග්‍රාහකයින්ගෙන් රු. 25,560,000 ක් ලැබී තිබුණ ද ඊට අදාළව අනුග්‍රාහක ආයතනය සමග ඇතිකර ගත් ගිවිසුම් ඇතුළු ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විවිධ පාර්ශව වෙත ගෙවන ලද අත්තිකාරම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ බැවින් අත්තිකාරම් ගෙවීම්, පියවීම් හා නොපියවූ අත්තිකාරම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආයතන 10 ක් වෙත ගෙවිය යුතු එකතුව රු. 9,134,709 ක මුදලක් වර්ෂ 02ක සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම අවසානයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,715,285 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,719,394 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 11,434,679 ක වර්ධනයක් පෙන්නුම්කර තිබුණි. ආදායම රු.40,029,889 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්යමණ්ඩල පරිපාලනය**

-------------------------------

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් සහ බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර නොතිබුණි. තවද සම්මේලනයේ සේවකයන් වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනු නඩත්තු කර නොතිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**5.1** **අයවැය ලේඛනමය පාලනය**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව ක්‍රමවත් මූල්‍ය පාලනයක් උදෙසා සමාලෝචිත වර්ෂයේ දී විධායක කමිටුව අනුමත කරන ලද අයවැය ලේඛනයක් පිළියෙල කොට ඒ අනුව අදාළ මෙහෙයුම් කාර්යයන් සිදුකර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සම්මේලනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | අයවැය පාලනය | සම්මේලනයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි අයවැය පාලනයක් ස්ථාපිත කර නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | ජංගම නොවන වත්කම් සහ ජංගම වත්කම් අතර නිසි වර්ගීකරණයක් සිදු කර නොතිබීම. |